


## මේ මමයි වැඩ අරඹයි

බුද්ධිනී ජයවර්ධනගේ සඳ කිඳුරි මං නව කතාව ඇසුරෙන් කෙරෙන ටෙලි නාට්‍යය "මේ මමයි" ලෙස නම් කර තිබේ, පියුමි බොතේජු ,චන්දික නානායක්කාර ,රොෂාන් පිලපිටිය බුද්ධික ජයරත්න, අංජලි ලියනගේ ,ඉෂාන් මෙන්ඩිස් ,නිල්මිණි සිගේරා කුසුම් පෙරේරා ,මානෙල් වානගුරු ,නිල්මිණි බුවනෙක ඇතුළු නළු නිළියන් රඟන මෙහි ගීත ගායනය නිරෝෂා විරාජිනිගෙනි. තිර රචනය බුද්ධිනී ජයවර්ධනගෙනි

## අභිනයේ අරුත නොදන්නා නිළිය



සුලේකා ජයවර්ධන ...මේ දිනවල ටෙලි නාට්‍ය කීපයකම සිටින නිළියක්. පසු ගිය දවසක ඇය රූපවාහිනී වැඩස-ටහනකට සහභාගී වුනේ තම සහෝදර ශිල්පීන් කීප දෙනෙක් සමගින් ,වැඩස-ටහන මෙහෙයුවේ නෙහාරා පීරිස් ,මෙහිදී සුලේකාට අභි නයෙන් ඉදිරිපත් කිරීමක් කරන්න සිදු වුනා .ඇය හැමෝගෙම ඉදිරියට ඇවිත් ඇහැව්වේ "මම දැන් මොකක්ද කරන්න ඕන" කියලා,

අනෙක් අය කිව්වා "ඔයාට දීලා තියන දෙය අභිනයෙන් පෙන්වන්න" කියලා,

එතකොට සුලේකා අහනවා "ඒ කියන්නේ මොකක්ද" කියලා, අනේ එයා අභිනය කියන්නෙ මොකක්ද කියලා දන්නෙ නැහැ,



# පුතා ගැන අහිංසක ආඩම්බරයක් තියෙනවා
## දිල්හානි ඒකනායක

**දිල්හානි මේ දවස් වල මොකද කරන්නේ?**
අලුත් කලා නිර්මාණ කීපයකට දායක වුනා. පසුගිය දවස්වල පුතා නිවාඩුවකට ලංකාවට ආව. එයා එක්ක ටිකක් වැඩිපුර කාලය ගත කලා.

**දැන් වැඩිය රඟපාන්නේ නැත්තේ ඇයි?**
ක්ෂේත්‍රයට එන අලුත ඕනම කෙනෙක් කැමති වැඩිපුර නිර්මාණ වලට දායක වෙන්න. සමහර වෙලාවට ඒවායේ ප්‍රමිතියක්වත් බලන්නේ නැහැ. එත් අත්දැකීම් වලින් පරිණත වෙද්දී යම් යම් සීමා මායිම් දාගන්නවා.

**ඒ කියන්නේ චරිත තෝරාබේරාගෙන රඟපානවා?**
ඇත්තටම ඔව්.

**පසුගිය කාලේ දේශපාලනය තුළ ඔබ ක්‍රියාකාරී සාමාජිකාවක් වුනා?**
ඇත්ත, හැබැයි ඒ දේශපාලනඥයෙක් වීමේ අරමුණ ඇතිව නෙවෙයි. මං මගේ රටට, මගේ රටේ මිනිස්සුන්ට හුගක් ආදරය කරන කෙනෙක්. රට යම් විය සනයකට ලක්වෙද්දී ඒ වෙනුවෙන් නැගී සිටින්න ශ්‍රී ලාංකික පුරවැසියෙක් විදියට මට අයිතියක් තියෙනවා, ඒ අයිතිය බොහොම සාධාරණ විදියට මම පාවිච්චි කළා.

**ඉදිරියේදී ඔබ එලෙස දේශපාලනය තුළ ක්‍රියාකාරී වෙනවද?**
නිතරම නෙවෙයි. අවශ්‍ය මොහොතක, අවශ්‍ය තැනක මම මගේ යුතුකම කරන්න පැකිලෙන්නේ නැහැ.

**ඔබ පොත පතට ආදරය කරන්නියෙක් කියල බොහෝ දෙනෙක් දන්නේ නැහැ.**
ඔව්. මං පොත්පත් කියවන්න හරිම කැමතියි. විවිධ ක්ෂේත්‍රයන් පිලිබඳ ලියැවුනු පතපොත, හරවත් නවකතා සහ බුද්ධ ධර්මය ගැන, මනෝ විද්‍යානව ගැන ලියවුන පොත් මං කියවනවා.

**ඒ විතරක් නෙවෙයි ඔබ අපේ ඉතිහාසයට බොහෝ සෙයින් ඇළුම් කරනවා.**
ඔව්, ඒ නිසාම ඉතිහාසය ගැන මම සොයා බලා දැනුවත් වෙනවා.

**නර්තනය ඔබෙන් ගිලිහිලාද?**
කවදාවත් නැහැ, අදටත් මම නර්තනයට ආදරය කරන කෙනෙක්.

**පුතා කලාවට සම්බන්ධ වෙනවට අකැමැතිද?**
නැහැ, ඉගෙනීම සම්පූර්ණ කරලා එයා කැමති ක්ෂේත්‍රකයක් තෝරගන්න එයාට නිදහස තියෙනවා. පුතාගේ කැමැත්තට පිටුපාන අම්මා කෙනෙක් නෙවෙයි මම.

**පුතා පිටරටක ඉන්න එක දුකක් නෙවෙයිද?**
පුතාගේ අනාගතය වෙනුවෙන් පුතා ළග නැති දුක දරාගන්න මට පුළුවන්. පොළොවේ පයගහල ඉන්න, මනුස්සකමට ආදරය කරන පුතෙක් මට ඉන්නේ. ඒ ගැන අහිංසක ආඩම්බරකමක් මට තියෙනවා. කොච්චර ඈතක හිටියත් මගේ පුතා නිදහස යුතු ලෙස පාවිච්චි කරන කෙනෙක් නෙවෙයි කියලා දන්නා නිසා හිතට බරක් නැහැ.

බුද්ධිනී ජයවර්ධන.



# මං දැන් ශක්තිමත් ගැහැනියක්
## උමයංගනා වික්‍රමසිංහ

උමයංගනා වික්‍රමසිංහ, තවත් විදියකින් කිව්වොත් දේදුනු , රසික හිත් ළග හරිම ආදරණීය චරිතයක්. ජීවිතේ බොහොම හෙමින් විඳින ඇය එක්ක කතා බහ කරන්න හිතුනා. ඒ ඇගේ ජීවිතය ගැන.

**උමයංගනා ජීවිතය දකින්නේ කොහොමද?**
අපි බලාපොරොත්තු වන වගේම බලාපොරොත්තු නොවන දේට මුහුන දෙමින් තමයි ජීවිතය අපට ගෙවන්න වෙන්නෙ. ඒ යථාර්ථය මම දකිනවා.

**මවගේ වියෝවීම දුවක් විදියට ඔයාට තවමත් දැනෙනවා?**
ඔව්, ඉස්සර මගේ ජීවිතේ හැම දෙයක්ම මං බෙදාගත්තේ මගේ අම්මා එක්ක. එත් අද මගේ අම්මා ජීවතුන් අතර නැහැ. හුගක් දේවල් මං තනියම විඳ දරාගන්නවා. එත් මං විශ්වාස කරනවා මගේ අම්මා තවම මං ළග ඉන්නවා කියලා.

**ඔයා, ඔයාව හඳුන්වන්න කැමති මොන විදියටද?**
මං බොහොම සාමාන්‍යඑ ජීවිතයක් ගත කරන සරල කෙනෙක්. ඒක මාව ළඟින් ඇසුරු කරන අයත් දන්නවා.

**හිතට දුකක් දැනුනහම මොකද කරන්නේ?**
සමහර දේවල් ළග මගේ ඇස්වලින් කඳුළු ගියපු තැන් අනන්තයි. ඒත් මං දැන් හිත හදාගෙනයි ඉන්නේ. ඒ බුදුදහමට අනුව හැඩගැහිලා. දැන් හිතට දුකක්, කලකිරීමක් ආවහම මට ඉවසන්න ශක්තිය තියෙනවා.

**ඒ කියන්නේ දැන් හිත තදයිද?**
හිත තදමද කියලා කියන්න බැහැ, බොහෝ තැන්වල මගේ හිත සංවේදී නොවනවා නෙ-වෙයි. ඒත් හිත තද කරගන්න තැනුත් ජීවිතේ තියෙනවා.

**ඔයාගේ ජීවිතේට ළඟ කවුද?**
මගේ තාත්තායි, මල්ලියි. අම්මගේ මතකයන් එක්ක අපි තුන් දෙනා ජීවත් වෙනවා.

බුද්ධිනී

